# සලාත්

## ප්‍රාථමික අවධියේ සිටින මුස්ලිම්වරුන්ට සලාතයේ මග පෙන්වීම් පොත

සකස් කිරීම
ඇස්. ඇම්. මන්සූර්

ප්‍රකාශනය
කැඳවීමේ හා මගපෙන්වීමේ සහයෝගී කාර්යාලය
අල් බදියා - සමාජ ඒකකය
රියාද්. සවුදි අරාබියාව.

طبعت على نفقة أحد المحسنين غفر الله له ولوالديه ولجميع المسلمين

**The Cooperative Office For Call & Guidance at Al-Badiah - Communities Section**

Under the Supervision of the Ministry of Islamic Affairs Endowment Guidance & Propagation.

P.O. Box 24932 Riyadh 11456 - Tel. 4330888/4330470 - Fax. 4301122 - Saudi Arabia

# සලාත්

## ප්‍රාථමික අවධියේ සිටින මුස්ලිම්වරුන්ට සලාතයේ මඟ පෙන්වීම් පොත

සකස් කිරීම

ඇස්. ඇම්. මන්සූර්


ප්‍රකාශනය

කැඳවීමේ හා මඟපෙන්වීමේ සහයෝගී කාර්යාලය

අල් බදියා - සමාජ ඒකකය

රියාද්. සවුදි අරාබියාව.

"ඔබගේ සලාතයන්හි බොහෝ සැලකිලිමත් වන්න. විශේෂයෙන්ම විශිෂ්ඨ ගුණයන්ගෙන් යුතුව සලාතය ඉටුකිරීමට විශේෂ අවධානය යොමු කරන්න."

● අල් කුර්ආන් 2:238

# සලාත්

## ප්‍රාථමික අවධියේ සිටින මුස්ලිම්වරුන්ට සලාතයේ මඟ පෙන්වීම් පොත

සකස් කිරීම
ඇස්. ඇම්. මන්සූර්

ප්‍රකාශනය
කැඳවීමේ හා මඟපෙන්වීමේ සහයෝගී කාර්‍යාලය
අල් බදීයා - සමාජ ඒකකය
රියාද්, සවුදි අරාබියාව.

"මම කෙසේ සලාත් කරන්න දුටුවේද, එසේම ඔබත් සලාත් කරන්න."

● බුහාරි, අහ්මද් ග්‍රන්ථ ඇසුරෙනි.

# පෙරවදන

ඉස්ලාමීක අනිවාර්ය කාර්යය වලින් ප්‍රධාන තැන ගන්නේ 'සලාත්' නම් වූ දේව නැමදුමය. 'මම මුස්ලිමෙකි' යනු කියන සෑම කෙනෙකුම මොනම අවස්ථාවකවත් සලාතය ඉටුකිරීමට පසුබට වීම ඉතාමත් බලවත් වැරැද්දකි.

මෙම කුඩා පොත ප්‍රාථමික අවධියේ සිටින මුස්ලිමුන් වෙනුවෙන් සකස්කරන ලද්දකි. සලාතයෙහි 'සුන්නත්' නම් වූ වැදගත් ක්‍රියාවන් රාශියක් ඇත. නමුත් මෙම පොතෙහි සලාතයේ ප්‍රධාන, සලාතය ඉටුවීමට උවමනා මූලික කරුණු පමණක් අඩංගුය. මෙයින් 'සුන්නත්' වැනි ක්‍රියාවන් පිටුදකින බව නොසැලකේ.

ඉස්ලාමය වැළඳගත් කෙනෙකු සලාත් කිරීමට යෑමේදී එය ඔහුට මහත් බරක් ලෙස නොතිබිය යුතුය යන අදහසින්ය මෙය මෙසේ සකස් කළේ. මෙය කියවා සලාතය සම්පූර්ණයෙන් ඉටුකරගෙන යන්නෙකු පසුව සලාතයේ සුන්නත් ද හොඳින් දැන පිළිපැදීම අති ශ්‍රේෂ්ඨය. එයට උදව්වන වෙනත් පොත් ද ඇත.

තවද, අනිවාර්යයෙන් ඉටුකළයුතු සලාත් හා ඒවාට පෙර/පසු සුන්නත් වශයෙන් ඉටුකළයුතු සලාත් යනාදිය පමණක් මෙහි ඇත. නමුත් තවත් සලාතයන් රාශියක් ඇත. ඒවා අනිවාර්යය නොවෙයි. එසේමුත්, ඒ සලාත් සම්බන්ධවත් දැනගෙන ඒවා ඉටුකළයුතු කාලයන් හි නිසිලෙස ඉටුකිරීම අල්ලාහ්ට අවනත වන සෑම මුස්ලිමෙකුගේම විශ්වාසය හා දේව භක්තිය ගෙන දක්වෙන ක්‍රියාවකි.

අල්ලාහ්, අප සැමෝම ඔහුගේ ආශීර්වාදයන්ට ලක් වූ යහපත් අය සමඟ එක් කරත්වා !

ප්‍රකාශකයෝ

**1993-05-11**

# ඉස්ලාම්

ඉස්ලාම්, මිනිසාගේ දෙලොව යහපත උදෙසා අල්ලාහ් විසින් පිරිනමනු ලැබූ ආගම යි; ජීවිත සැලැසුම යි.

ක්‍රිස්තු දහම ක්‍රිස්තුස් වහන්සේගේ නමින්ද, බුද්ධාගම බුදුන් වහන්සේගේ නමින්ද, මාර්ක්ස්වාදය කාර්ල්මාක්ස්ගේ නමින් ද ව්‍යවහාර වේ. හිඳු ආගම හා යුදෙව් ආගම ඒ ඒ ආගම් උපත ලැබූ සමාජයන්ගේ නමින් ව්‍යවහාර වේ.

ඉස්ලාමය එවැනි ආගමක් නොවේ. එයට තනි මිනිසෙකු හෝ සමාජයක් සමඟ කිසිම විශේෂ බැඳීමක් නැත. මුහම්මද් නබිතුමාගේ නමින්ද එය පැවත එන්නේ නැත.

ඉස්ලාම් යන්නෙහි තේරුම කීකරු වීම, අවනතවීම යනු වේ. එයට ශාන්තිය, සමාදානය නම් වූ අර්ථයන්ද ඇත. යමෙකු අල්ලාහ්ට සම්පූර්ණයෙන් කීකරු වී ජීවත් වන්නේ නම් - ඉස්ලාම් අනුව ක්‍රියා කරන්නේ නම් ඔහු කරා ශාන්තිය හා සමාදානය ළඟාවන්නේය.

ඉස්ලාම් හි දෙවියන් රාශියක් ඇදහීම පිළිගනු නොමැත. පිළිම, පින්තූරු, ගස්, ගල්, ගින්දර, ඉර, හඳ, මිනිසුන් කෙරේ වැඳ වැටීමක් නැත; භාරවීමක් ද නැත. ඉස්ලාම්, මිනිසාගේ ස්වාභාවික උවමනාවන්ට විරුද්ධ නොවී තිසිලෙස ලබාදෙන ආගමකි, ගැහැණියට උසස් තැනක් දෙන ඉස්ලාමයෙහි ජාති, කුල, වර්ණ, භාෂා, දේශ භේදයන් කිසිවක් නැත.

ඇත්තේ එකම දෙවි අල්ලාහ් පමණය; එකම මිනිස් සමාජයක් ය. එමනිසා මුළු මිනිස් සමාජයම අවනත විය යුත්තේ එකම දෙවියන් වූ අල්ලාහ්ට පමණක් ය.

ඉස්ලාමයේ ඉගැන්වීම මෙයයි.

---

إِنَّ الدِّينَ عِندَ اللَّهِ الْإِسْلَامُ

(අල් කුර්ආන් 3:19)

"අල්ලාහ් වෙත අනුමත වූ එකම ජීවිත සැලැස්ම ඉස්ලාම් නම් වේ."

යනු අල්කුර්ආනය කියයි.

# විශ්වාස කළයුතු කරුණු හය (6)

පහත සඳහන් කරුණු හය(6) යමෙක් සම්පූර්ණයෙන් විශ්වාස කරන්නේද ඔහු මුස්ලිමෙකු වෙයි.

1. آمَنْتُ بِاللّٰهِ — ආමන්තුබිල්ලාහි
2. وَمَلَائِكَتِهِ — ව මලාඉක්කතිහී
3. وَكُتُبِهِ — ව කුතුබිහී
4. وَرُسُلِهِ — ව රුසුලිහී
5. وَالْيَوْمِ الْآخِرِ — වල් යව්මිල් ආහි(ඃ)රි
6. وَالْقَدْرِ خَيْرِهِ وَشَرِّهِ مِنَ اللّٰهِ تَعَالَى — වල්කද්රි හ(ඃ)යිරිහි වසර්රිහි මිනල්ලාහි තආලා

පරිවර්තනය:

1. අල්ලාහ්ගේ ඒකියභාවය (ඔහුගේ)
2. දේව දූතයන් (ඔහුගේ)
3. පුස්තක (ඔහුගේ)
4. (නබිවරු) වක්තෘවරු
5. විනිශ්චය දිනය
6. හොඳ නොහොඳ සෑමයක්ම අල්ලාහ්ගේ පෙරම්නුම අනුව ක්‍රියාවන බව ය. මේ වා විශ්වාස කිරීම අනිවාර්‍ය ය. මෙයට 'ඊමාන්' යනු කියනු ලැබේ.

---

قُلْ يَٰعِبَادِ ٱلَّذِينَ ءَامَنُوا۟ ٱتَّقُوا۟ رَبَّكُمْ

"(නබිතුමාණෙනි !) කියන්න: විශ්වාසවන්ත යන් වූ මගේ වහලුනි ! ඔබගේ දෙවියාට බිය වන්න."

(අල් කුර්ආන් 39:10)

# අනිවාර්ය කාර්යයන් පහක් (5)

عَنِ ابْنِ عُمَرَ رَضِيَ اللّٰهُ عَنْهُمَا قَالَ قَالَ رَسُوْلُ اللّٰهِ ﷺ بُنِيَ الْإِسْلَامُ
عَلٰى خَمْسٍ شَهَادَةِ أَنْ لَا إِلٰهَ إِلَّا اللّٰهُ وَأَنَّ مُحَمَّداً عَبْدُهُ وَرَسُوْلُهُ وَإِقَامِ الصَّلَاةِ
وَإِيْتَاءِ الزَّكَاةِ وَالْحَجِّ وَصَوْمِ رَمَضَانَ - مُتَّفَقٌ عَلَيْهِ.

මුහම්මද් (සල්) තුමා පැවසූ බව ඉබ්නු උමර් (රලි) තුමා මෙසේ දන්වයි:
**ඉස්ලාම් නමැති ගොඩනැගිල්ල කුලුනු පහක් මත ගොඩනගා ඇත.**

**(එම කුලුනු පහ නම්)**

1. 'අල්ලාහ් හැර (නැමදීමට, අවනත වීමට, නීති සම්පාදනය කිරීමට) වෙන දෙවි කෙනෙක් නැත; මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ වහලෙකු හා වක්තෘවරයෙකු වෙයි' යනු සාක්ෂි දැරීම
2. සලාතය ඉටු කිරීම
3. සකාත් - දුගී බද්ද ගෙවීම
4. හජ් වන්දනා ඉටු කිරීම
5. රමළාන් මසතුළ උපවාසයේ යෙදීම

(බුහාරි, මුස්ලිම් ග්‍රන්ථයන්)

මෙම කාර්යයන් පහ මුස්ලිමෙකු විසින් අනිවාර්යයෙන්ම කළ යුතු වේ. මේ සඳහා නියම කාලය හා අනෙකුත් පහසුකම් ලැබුනු විට කිසිසේත් නොකර සිටීමට අවසර නැත.

ඉස්ලාමය තුළට පිවිසීමේ ප්‍රධාන දෙරටුව වන්නේ අල්ලාහ්ගේ ශ්‍රේෂ්ඨත්වය, බල මහිමය, ඔහුට කොටස් කරුවන් නැති බව, ඔහු පමණය වැඳුම් පිදුම් ලැබීමට සුදුස්සා යන්නත් මුළු සිතින්ම පිළිගෙන, විශ්වාස කිරීම වේ. මෙම විශ්වාසයේ ඉතාමත් කුඩා කැළලක් ඇතිවුවත් එයින් ජීවිතය අර්ථවත් නොවේ. මෙහි දෙවෙනි කොටස නම් මුහම්මද් (සල්) තුමාගේ නබිත්වය විශ්වාස කිරීම ය. මෙම කරුණු දෙකම එක වාක්‍යයෙහි දක්නට ඇත.

එම වාක්‍යය, 'මම ඉස්ලාමය අනුව ජීවත් වෙමි' යනු හරයේ සිතා, විශ්වාස කර, මුවින් කීම අවශ්‍ය වේ. එවිට එසේ කියන්නා මුස්ලිමෙකි.

## أَشْهَدُ أَنْ لَا إِلٰهَ إِلَّا اللّٰهُ
## وَأَشْهَدُ أَنَّ مُحَمَّدًا عَبْدُهُ وَرَسُولُهُ

අෂ්හදු අන්ලාඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු.

මෙම වාක්‍යය මුවින් කියා මුස්ලිමෙකු වූ සෑම ස්ත්‍රී පුරුෂයන්ම , දිනපතා පස්වේල් සලාත් කිරීම අනිවාර්‍ය වේ.

සලාතය ගැන අල්ලාහ් මෙසේ පවසයි:

اتْلُ مَا أُوحِيَ إِلَيْكَ مِنَ الْكِتَابِ
وَأَقِمِ الصَّلَاةَ ۖ إِنَّ الصَّلَاةَ تَنْهَىٰ
عَنِ الْفَحْشَاءِ وَالْمُنكَرِ ۗ
وَلَذِكْرُ اللَّهِ أَكْبَرُ ۗ وَاللَّهُ يَعْلَمُ مَا تَصْنَعُونَ

"(නබිතුමාණෙනි ! ) මෙම ග්‍රන්තයෙන් ඔබට දන්වූ දේ ඔබ ගෙන කියන්න. තවද සලාතය ඉටුකරන්න. නිසැකව සලාත් කිරීම දුශ්ශීල ක්‍රියාවන්ගෙන් හා පාප ක්‍රියාවන්ගෙන් (මිනිසා) බේරාගන්නේය. අල්ලාහ් සිහිපත් කිරීම (භාවනාවේ යෙදීම) නිසැකව ම උතුම් ක්‍රියාවකි. තවද, ඔබ කරන සියල්ල අල්ලාහ් දකින්නේ ය."

(අල් කුර්ආන් 29:45)

| සලාත් හා ඉටුකලයුතු වේලාවන් | | | පෙර සුන්නත් | ෆර්ල් අනිවාර්‍ය | පසු සුන්නත් |
|---|---|---|---|---|---|
| 1. | ෆජ්ර් | උදෑසන | 02 | 02 | - |
| 2. | ලුහර් | දවල් | 02 හෝ 04 | 04 | 02 |
| 3. | අසර් | පස්වරු | - | 04 | - |
| 4. | මැ:රිබ් | සවස | - | 03 | 02 |
| 5. | ඉෂා | රාත්‍රිය | - | 04 | 02+විත්ර් |

# වුළු හෙවත් ධෝවනය කිරීම


සලාතය ඉටුකිරීමට යන කෙනෙකු අනිවාර්යයෙන්ම 'වුළු' කළ යුතුය.

## වුළු කළයුතු ක්‍රමය:

1. 'වුළු කරමි' යනු 'නියියත්' කර (සිතා) ගැනීම.

2. بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ 'බිස්මිල්ලා හිර්රහ්මා නිර්රහීම්'

   මෙය කියා වුළු කිරීමට පටන් ගැනීම





3. අත්දෙක මැණික් කටුව දක්වා තුන්වරක් සේදීම

4. කට හා නාසය තුන්වරක් සේදීම

5. උඩු තලලෙ සිට නාඩිය දක්වාත් එක් කණක සිට අනෙක් කණ දක්වාත් මුහුණ තුන්වරක් සේදීම.

6. අත් දෙක වැලමිට දක්වා තුන් වරක් සේදීම

7. හිස එක්වරක් තෙත් අතින් පිරිමැදීම 'මස්හ්' කිරීම.



8. කන්දෙක එක්වරක් තෙත් අතින් පිරිමැදීම - මස්හ් කිරීම

9. දෙපා තුන්වරක් සේදීම.

මෙහි කී පරිදි දේවනය කරන විට සමේ රැලි වැටුනු තැන් හොඳට සෝදන්න අමතක නොකරන්න.

'වූළු' ව හෝ තයම්මුම තිම වූ පසු පහත සඳහන් ප්‍රාර්ථනාව කළ යුතුය.

أَشْهَدُ أَنْ لاَ إِلَهَ إِلاَّ اللَّهُ وَحْدَهُ لاَ شَرِيْكَ لَهُ وَأَشْهَدُ أَنَّ مُحَمَّداً

عَبْدُهُ وَرَسُولُهُ. اللَّهُمَّ اجْعَلْنِي مِنَ التَّوَّابِينَ وَاجْعَلْنِي مِنَ الْمُتَطَهِّرِينَ ○

**අෂ්හදු අන්ලාඉලාහ ඉල්ලල්ලාහු වහ්දහු ලා ෂරීකලහු ව අෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු ව රසූලුහු. අල්ලාහුම්මජ්අල්නි මිනත් තව්වාබීන වජ්අල්නී මිනල් මුතතහ්හිරීන්.**

**පරිවර්තනය:** "අල්ලාහ් හැර වැඳුම් පිදුම් කිරීමට වෙන කිසිවෙකු නැත. ඔහු එක්කෙනෙකි; ඔහුට සමව කවුරුත් නැත යනු මම සාක්ෂි දරමි. එමෙන්ම, මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ වහලෙකුයි එක්තැවරයෙකුයි වෙයි යනු මම සාක්ෂි දරමි. යා අල්ලාහ් ! තමන්ගේ පාපයනට පසුතැවෙන හා චිත්ත පවිත්‍රතාවයෙන් වෙසෙන අය අතුරෙහි මා තබනු මැනවි."

(මුස්ලිම්, තිර්මිදි ග්‍රන්ථ ඇසුරෙනි)

## 'වුළු'ව නිෂ්ඵල වන කාර්යයන්

* මල, මූත්‍රා පහකිරීම
* පිටුපසින් යමක් පිටවීම (වාතය පිටවීම)
* තමාට වෙන්නේ මොනවාද යන්න නොදන්නා තරමක තද නින්දේ සිටීම.
* ඔටුමය් අනුභව කිරීම

### අනිවාර්ය නෑම සඳහා වූ කාරණයන්
* ස්ත්‍රී පුරුෂ ලිංගික ක්‍රියාවේ යෙදීම
* ධාතු පිටවීම
* ස්ත්‍රීන්ට ඔසප් වීම (හයිලු පැමිණීම)
* ස්ත්‍රීන්ට දරු ප්‍රසූතයෙන් පසු රුධිරය පිට වීම. (නිෆාස්)
* කෙනෙකු ඉස්ලාමය වැළඳ ගැනීම
* මුස්ලිමෙකු මරණයට පත්වීම

මෙවැනි අවස්ථාවක් ඇති වූ විට 'අපිරිසිදුභාවයෙන් ඉවත් වීමට නාන්නෙමි' යනු සිතා - නියියත් කර - සම්පූර්ණයෙන් ශරීරය තෙමෙන ලෙස නාන්න/නාවන්න ඕනෑ ය. මෙසේ නෑමට පෙර අත්දෙක සේදීම, රහස් ප්‍රදේශය හොඳට සේදීම, සලාත්වලට මෙන් 'වුළු' කරගැනීම අවශ්‍යය.

# තයම්මුම් කිරීම
* ජලය නැතිවීම
* අධික ශීතල
* ජලය ඇල්ලීමට බැරිතරම් රෝගාතුර වී සිටීම
* ජලය ඇතත් නෑම, වුළු කිරීම වැනි කාර්යයන් හැර වෙනත් ඉතාමත් අවශ්‍ය කාර්යයන්වලට පමණක් සීමාසහිතව තිබීම.

මෙවැනි අවස්ථාවන් හිදී තයම්මුම් කිරීමට අවසර ඇත.

### තයම්මුම් කරන ක්‍රමය:
මෙහිදීත් තයම්මුම් කරන්න යන බව නියියත් - තබා 'බිස්මිල්ලාහ් කිව යුතුය. පසුව, අත් දෙක පිරිසිදු පසෙ හි එක්වරක් තබා, පළමුව මුහුණෙහි පිරිමැදිය යුතුය.; දෙවෙනුව, දකුණු අතේ මැණික් කටුවෙන් පහළ අතේ එලි පැත්තේ එක්වරකුයි, එලෙසම වම් අතේ එක්වරකුයි පිරිමැදිය යුතුය.

වුළු ව නිෂ්ඵල වන සෑම ක්‍රියාවක්ම තයම්මුම ද නිෂ්ඵල කරයි. තවද, ජලය නොලැබුනු තැනැත්තාට ජලය ලැබීම, ජලය ඇල්ලීමට තරම් බැරිව රෝගාතුර වී සිටිය තැනැත්තාගේ රෝගය සුවවීම, ජලය පාවිච්චි කිරීමට තිබුන අවහිරය නිරාකරණය වීම යනාදියෙනුත් තයම්මුම නිෂ්ඵල වන්නේය.

**වැදගති :**

යමෙකු වුළු කළායින් පසුව තම දෙපාවලට මේස් (SOCKS) දාගත්තේ නම් සාමාන්‍ය දවස්වල පැය 24 ටත් ගමන් බිමන්වලදී දින 03 ටත් එම මේස් නොගලවා, ඒවා මත තෙත් අතින් මස්හ් නම් වූ පිරිමැදීම කළ හැක. නමුත් වුළු කළයුතු අනෙක් කොටස් පිළිවෙළට වුළු කළ යුතුමය.

# සලාත් කරමු

"මරණින් පසු වූ විනිශ්චය දිනයෙහි මිනිසාගේ ක්‍රියා වන්ගෙන් පළමුව ප්‍රශ්ණ කරනු ලබන්නේ ඔහුගේ සලාත් ගැනය. එය හොඳකාරව තිබුනේ නම් ඔහුගේ (ජීවිතය) සාර්ථක වන්නේ ය. එය (සලාතය) හොඳකාර නොවන්නේ නම් ඔහු පාඩු විඳින්නෙකු හා දුකට පත්වන්නෙකු වන්නේය."

● පැවසුවේ : මුහම්මද් (සල්) තුමා ● දන්වූයේ : අබූහුරෙයිරා (රළි) තුමා
● තිර්මිදී, ඉබ්නුමාජා ග්‍රන්ථ ඇසුරෙනි.

## අදාන් - සලාතයට කැඳවීම

'අදාන්' යනු ඒ ඒ නියමිත වේලාවන් හිදී සලාත් කිරීම සඳහා මස්ජිදයෙන් කෙරෙන ඇරයුමයි.

**එය මෙසේය:**

| | |
|---|---|
| اَللّٰهُ اَكْبَرُ<br>**අල්ලාහු අක්බර්**<br>**(සිව් වරක්)** | "අල්ලාහ් අති ශ්‍රේෂ්ඨය." |
| اَشْهَدُ اَنْ لَّا اِلٰهَ اِلَّا اللّٰهُ ط<br>**අෂ්හදු අන්ලාඉලාහ ඉල්ලල්ලාහ්**<br>**(දෙවරක්)** | "අල්ලාහ් හැර වෙන දෙවි කෙනෙකු නැත' යනු බව මම සාක්ෂි දරමි." |
| اَشْهَدُ اَنَّ مُحَمَّداً رَّسُولُ اللّٰهِ ط<br>**අෂ්හදු අන්න මුහම්මදර් රසූලුල්ලාහ්**<br>**(දෙවරක්)** | "ස්ථිරවම මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ වක්තෘ බව සාක්ෂි දරමි." |
| حَيَّ عَلَى الصَّلٰوةِ ط<br>**හයිය අලස්සලා(ත්)**<br>**(දෙවරක්)** | "සලාත් කිරීමට එන්න" |
| حَيَّ عَلَى الْفَلَاحِ ط<br>**හයිය අලල් පලාහ්**<br>**(දෙවරක්)** | "ජය ලබාගන්න එන්න" |

| | |
|---|---|
| اَللّٰهُ اَكْبَرُ ط<br>**අල්ලාහු අක්බර්**<br>(දෙවරක්) | "අල්ලාහ් අති ශ්‍රේෂ්ඨ ය" |
| لَا اِلٰهَ اِلَّا اللّٰهُ ٥ط<br>**ලා ඉලාහ ඉල්ලල්ලාහ්**<br>(එක්වරක්) | "අල්ලාහ් හැර වෙන දෙවියෙකු නැත." |
| ෆජ්ර් සලාතයෙහි පමණක්<br>اَلصَّلٰوةُ خَيْرٌ مِنَ النَّوْمِ ٥ط<br>**අස්සලාත්තු හ( ඃ )යිරුම් මිනන් නව්ම්**<br>(දෙවරක්) | "නින්දට වඩා සලාතය උතුම් ය." |

මෙම අදානය මස්ජිදයේ මුඅද්දින් විසින් ඇරයුම් කිරීම අසා සිටින අනෙක් මුස්ලිම්වරු එයම තමනුත් කිව යුතුයි. නමුත් 'හයිය අලස් සලා(ත්), හයිය අලල් ෆලාහ්' යූ වාක්‍ය යන් ඇසුනු විට "ලා හව්ල වලා කුව්වත ඉල්ලා බිල්ලාහ්" යනු කිව යුතුය.

අදානය නිම වූ පසු මුහම්මද් නබි (සල්) තුමා වෙත සලවාත් කීමත්, ඉන්පසුව ප්‍රාර්ථනා කිරීමත් අවශ්‍ය ය.

සලවාත්

اَللّٰهُمَّ صَلِّ عَلٰى مُحَمَّدٍ وَّعَلٰى آلِ مُحَمَّدٍ كَمَا صَلَّيْتَ عَلٰى إِبْرَاهِيْمَ وَعَلٰى آلِ
إِبْرَاهِيْمَ إِنَّكَ حَمِيْدٌ مَّجِيْدٌ ٥ط اَللّٰهُمَّ بَارِكْ عَلٰى مُحَمَّدٍ وَّعَلٰى آلِ مُحَمَّدٍ كَمَا
بَارَكْتَ عَلٰى إِبْرَاهِيْمَ وَعَلٰى آلِ إِبْرَاهِيْمَ إِنَّكَ حَمِيْدٌ مَّجِيْدٌ ٥ط

**අල්ලාහුම්ම සල්ලි අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා සල්ලයිත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක්ක හමීදුම් මජිද්. අල්ලාහුම්ම බාරික් අලා මුහම්මදින් වඅලා ආලි මුහම්මදින් කමා බාරක්ත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම ඉන්නක හමීදුම් මජිද්.**

**පරිවර්තනය** : යා අල්ලාහ් ! මුහම්මද් (සල්) තුමා වෙත හා එතුමාගේ පවුලේ අය වෙත, ඉබ්රාහිම් (අලෛයි) තුමා හා එතුමාගේ පවුලේ අය වෙත ආශීර්වාද කළාමෙන් කරන්වා ! ස්ථිර වශයෙන් ඔබටය සියලු ප්‍රශංසාවන් හා ශ්‍රේෂ්ඨත්වයන් හිමි වන්නේ.

යාඅල්ලාහ් ! මුහම්මද් (සල්) තුමා වෙත හා එතුමාගේ පවුලේ අය වෙත, ඉබ්රාහිම් (අලෙයි) තුමා හා එතුමාගේ පවුලේ අය වෙත කරුණාව දක්වූවාමෙන් කරත්වා ! ස්ථිර වශයෙන් ඔබටය සියලු ප්‍රශංසාවන් හා ශ්‍රේෂ්ඨත්වයන් හිමිවන්නේ.

දුආ ප්‍රාර්ථනාව

اللّٰهُمَّ رَبَّ هٰذِهِ الدَّعْوَةِ التَّامَّةِ وَالصَّلٰوةِ الْقَائِمَةِ آتِ مُحَمَّدَنِ الْوَسِيْلَةَ وَالْفَضِيْلَةَ
وَابْعَثْهُ مَقاماً مَحْمُودَنِ الَّذِي وَعَدْتَهُ ○

**අල්ලාහුම්ම රබ්බ හාදිහිද් දඃවතිත් තාම්මත්ති වස්සලාත්තිල් කාඉමත්ති. ආත්ති මුහම්මදනිල් වසීලත්ත වල් පළීලත්ත වබ්අද්හු මකාමන්ම් මහ්මූද නිල්ලදි වඃද්තහු.**

**පරිවර්තනය :** යා අල්ලාහ් ! සම්පූර්ණ වූ මෙම සලාතයට අයත් අධිපති තුමණි. මුහම්මද් (සල්) තුමාණන්ට 'වසීලා' නම් ආදරයත්, උසස් තත්වයත්, කීර්තියත්, ගෞරවයත් දෙනු මැනව. තවද, ඔබ පොරොන්දු වූ පරිදි කීර්තියට ලක් වූ උසස් ස්ථානයේ වැජඹ සිටීමට එතුමාණන් වෙත කරුණාව දක්වනු මැනව."

اللّٰهُ أَكْبَرُ اللّٰهُ أَكْبَرُ
أَشْهَدُ أَنْ لَّا إِلٰـهَ إِلَّا اللّٰهُ ○
أَشْهَدُ أَنَّ مُحَمَّداً رَّسُولُ اللّٰهِ ○
حَيَّ عَلَى الصَّلٰوةِ ○ حَيَّ عَلَى الْفَلَاحِ ○
قَدْ قَامَتِ الصَّلٰوةُ ○ قَدْ قَامَتِ الصَّلٰوةُ ○ط
اللّٰهُ أَكْبَرُ اللّٰهُ أَكْبَرُ ○ لَا إِلٰـهَ إِلَّا اللّٰهُ ○ط


මස්ජිදයෙහි සාමුහිකව සලාත් කිරීමට කෙරෙන දෙවෙනි ඇරයුම. මෙයට අරාබි භාෂාවෙන් "ඉකාමත්" යනුවෙන් කියනු ලැබේ.

## සලාත් කිරීමේ පිළිවෙල

යමෙකු 'වුළු' කර සලාත් කිරීමට පැමිණුනු විට තමන් ඉටුකිරීමට යන සලාතය සිතා - නියියත් - කර මක්කමේ කඃබාව (කිබ්ලාව) දෙසට මුහුණ පා කෙළින් සිටිය යුතුයි. නියියතය මුවින් කීම අවශ්‍ය නොවේ: එය නබි තුමාගේ ආදර්ශයක් ද නොවේ.

පසුව, මෙහි 'A' පින්තූරයේ ඇති පරිදි අත්දෙක කණ දක්වා ඔසවා 'අල්ලාහු අක්බර්' යනු තක්බීර් කියමින් වමත පපුව මත තබා දකුණත එයට උඩින් තැබිය යුතුය.

'A'



දැන් වෙන කොහෙවත් නොබැලිය යුතුයි: සිනාසීම, කථාකිරීම, වෙනත් කාර්‍යයන්වල සිත යොමු කිරීම නොකළ යුතුයි. තමන් සුජුද් කරන විට නලළ කොතැන තබාගන්නේද එතැන බලමින් පහත සඳහන් ප්‍රාර්ථනාව කළ යුතුයි.

سُبْحَانَكَ اَللّٰهُمَّ وَبِحَمْدِكَ وَتَبَارَكَ اسْمُكَ وَتَعَالٰى جَدُّكَ
وَلَآ إِلٰـهَ غَيْرُكَ ط

**සුබ්හානකල්ලාහුම්ම ව බිහම්දික්ක වතබාරක්ක ස්මුක්ක වතආලා ජද්දුක වලා ඉලාහ(උ)කයිරුක්ක**

**පරිවර්තනය** : යා අල්ලාහ් ! ශ්‍රේෂ්ඨත්වය ඔබ සතුය; සියළු ප්‍රශංසා ඔබටම ය. ආශීර්වාදයට හා උසස් කීර්තියට හිමි වූ ඔබගේ නාමය ප්‍රශංසනීය වෙයි. තවද ඔබ හැර. වැඳුම් පිදුම් කිරීමට වෙන දෙවියෙකු නැත."

මෙම ප්‍රාර්ථනාවෙන් පසුව සූරා ෆාතිහා ව පාරායනා කළ යුතුය. සලාතයෙහි සූරා ෆාතිහාව පාරායනා කිරීම අනිවාර්‍යය.

أَعُوذُ بِاللّٰهِ مِنَ الشَّيْطَانِ الرَّجِيْمِ ط

**අඌදු බිල්ලාහි මිනශ් සයිතානිර්රජිම්**

**මහා දයාත්විත, මහා කරුණාන්විත**
**අල්ලාහ්ගේ නාමයෙනි.**

بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ

විශ්වායාධිපති වූ, මහා දයාන්විත,
මහා කරුණාන්විත, විනිශ්වය දිනයේ
අධිපති වූ අල්ලාහ්ට පමණක් සියලු
ප්‍රසංශාවන් අයත් වේ. ඔබ පමණක් අපි
ඉබාදත් කරමු. (පූදමු) ඔබෙන් පමණක්
පිහිට පතමු. ඔබගේ ආශිර්වාදය ලද්දවූ.
ඔබගේ කෝපය නොලද්දවූ. නොමග
නොගියවුන්ගේ මාර්ගය වූ ඍජු මාර්ගය
අපට දක්වනු මැනව.

اَلْحَمْدُ لِلّٰهِ رَبِّ الْعٰلَمِيْنَ ۝ الرَّحْمٰنِ
الرَّحِيْمِ ۝ مٰلِكِ يَوْمِ الدِّيْنِ ۝ اِيَّاكَ
نَعْبُدُ وَاِيَّاكَ نَسْتَعِيْنُ ۝ اِهْدِنَا الصِّرَاطَ
الْمُسْتَقِيْمَ ۝ صِرَاطَ الَّذِيْنَ اَنْعَمْتَ عَلَيْهِمْ
غَيْرِ الْمَغْضُوْبِ عَلَيْهِمْ وَلَا الضَّآلِّيْنَ ۝

---

"අඌදුබිල්ලාහි මිනෂ්ෂෛතානිර් රජීම් "පලවා හරිනු ලැබූ ෂෛතාන්ගේ නපුරෙන් සිට අල්ලාහ් වෙත ආරක්ෂාව සොයන්නෙමි."

**බිස්මිල්ලා හිර්රහ්මා නිර්රහීම්**

අල්හම්දුලිල්ලාහි රබ්බිල් ආලමීන්. අර්රහ්මා නිර් රහීම්. මාලික්කි යව්මිද්දීන්. ඉයියාක නෑබුදු ව ඉයියාක නස්තඊන්. ඉහ්දිනස් සිරාතල් මුස්තකීම්. සිරාතල්ලදීන අන්අම්ත්ත අලෛයිහිම් (غ)ගෑයිරිල් ම(غ)ෑලූබි අලෛයිහිම් වලල් ලාල්ලීන්. (ආමීන්)

සූරා ෆාතිහාව මෙසේ පාරායණා කළ පසු පහත සඳහන් සූරාවලින් එකක් හෝ කුර්ආනයේ වෙනත් සූරාවක් හෝ පාරායණා කළ හැක.

---

(1)

بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ
බිස්මිල්ලා හිර්රහ්මා නිර්රහීම්

قُلْ هُوَ اللّٰهُ اَحَدٌ ۝١
කුල්හුවල්ලාහු අහද්

اَللّٰهُ الصَّمَدُ ۝٢
අල්ලාහුස් සමද්

لَمْ يَلِدْ وَلَمْ يُوْلَدْ ۝٣
ලම්යලිද් වලම් යූලද්

وَلَمْ يَكُنْ لَّهٗ كُفُوًا اَحَدٌ ۝٤
වලම්යකුන්ලහු කුෆුවන් අහද්

(2)

بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ
බිස්මිල්ලා හිර්රහ්මා නිර්රහීම්

قُلْ اَعُوْذُ بِرَبِّ الْفَلَقِ ۝١
කුල්අඌදු බිරබ්බිල් ෆලක්

مِنْ شَرِّ مَا خَلَقَ ۝٢
මින්ෂර්රි මා(خ)හලක්

වමින්සර්රි(ග්)කාසිකින් ඉදාවකබ්
وَمِنْ شَرِّ غَاسِقٍ إِذَا وَقَبَ ٣

වමින්සර්රින්නෆ්ෆාදති ෆිල්(උ)කද්
وَمِن شَرِّ ٱلنَّفَّـٰثَـٰتِ فِى ٱلْعُقَدِ ٤

වමින්සර්රි හාසිදින් ඉදා හසද්
وَمِن شَرِّ حَاسِدٍ إِذَا حَسَدَ ٥

(3)

බිස්මිල්ලා හිර්රහ්මා නිර්රහීම්
بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَـٰنِ ٱلرَّحِيمِ

කුල් අඌදු බිරබ්බින්නාස්
قُلْ أَعُوذُ بِرَبِّ ٱلنَّاسِ ١

මලිකින්නාස්
مَلِكِ ٱلنَّاسِ ٢

ඉලාහින්නාස්
إِلَـٰهِ ٱلنَّاسِ ٣

මින්සර්රිල් වස්වාස්. අල්(ඛ)හන්නාස්
مِن شَرِّ ٱلْوَسْوَاسِ ٱلْخَنَّاسِ ٤

අල්ලදී යුවස්විසු ෆී සුදූරින්නාස්
ٱلَّذِى يُوَسْوِسُ فِى صُدُورِ ٱلنَّاسِ ٥

මිනල් ජින්නත්ති වන්නාස්
مِنَ ٱلْجِنَّةِ وَٱلنَّاسِ ٦

(4)

බිස්මිල්ලා හිර්රහ්මා නිර්රහීම්
بِسْمِ ٱللَّهِ ٱلرَّحْمَـٰنِ ٱلرَّحِيمِ

කුල් යාඅයියුහල් කාෆිරූන්
قُلْ يَـٰٓأَيُّهَا ٱلْكَـٰفِرُونَ ١

ලා අඃබුදු මා තඃබුදූන්
لَآ أَعْبُدُ مَا تَعْبُدُونَ ٢

වලා අන්තුම් ආබිදූන මා අඃබුදු
وَلَآ أَنتُمْ عَـٰبِدُونَ مَآ أَعْبُدُ ٣

වලාඅන ආබිදුම් මා අබද්තුම්
وَلَآ أَنَا۠ عَابِدٌ مَّا عَبَدتُّمْ ٤

වලා අන්තුම් ආබිදූන මා අඃබුදු
وَلَآ أَنتُمْ عَـٰبِدُونَ مَآ أَعْبُدُ ٥

ලකුම් දීනුකුම් වලියදීන්.
لَكُمْ دِينُكُمْ وَلِىَ دِينِ ٦


පරිවර්තනය :

1) පවසන්න : අල්ලාහ් ඒකයෙකි. අල්ලාහ් කිසිදු අවශ්‍යතාවයක් නොමැත්තෙකි. ඔහුට (යමෙකු) ඉපදුනේද නැත. වෙනත් කෙනෙකුට දව (ඔහු) උපන්නේද නැත. තවද, ඔහුට සමාන කිසිවකු නැත.

2) පවසන්න : අරුණෝදයේ පරිපාලකයාගෙන් මම ආරක්ෂාව පතමි. ඔහුගේ මැවිලිවල උවදුරින්, තවද, අඳුරු (රාත්‍රිය) ඇතිවූ විට සිදුවන උවදුරුවලින් (ද), තවද, ගැටවලට (මතුරා) පිඹින ස්ත්‍රීන්ගේ උවදුරුවලින් තවද, ඊර්ෂ්‍යා කරන්නාවුන් ඊර්ෂ්‍යා කිරීමෙන් ඇතිවන උවදුරුවලින් ද(මම ආරක්ෂාව පතමි.)

3) **පවසන්න** : මිනිසුන්ගේ පරිපාලකයාගෙන් ආරක්ෂාව පතමි, (ඔහු) මිනිසුන්ගේ රජු; මිනිසුන්ගේ දෙවියා ය, සැඟ වී සිට මානසික කරදර ඇති කරන්නාගේ උවදුරුවලින් , (අල්ලාහ්ගේ ආරක්ෂාව පතමි.) ඔහු මිනිසුන්ගේ සිත් තුළ කරදර ඇති කරන්නා. (මෙවැන්නන්) ජින් හා මිනිසුන් අතර සිටින්නෝය.

4) **පවසන්න** : ම් ප්‍රතික්ෂේප කරන්නෙනි ! (කාපිර්වරුනි ! ) ඔබ වඳින දේවල් මා නොවඳිමි. මා වඳින්නා (අල්ලාහ්) ඔබලා වඳින්නේද නැත. තවද, ඔබ වඳින දේවල් මම වඳින්නෙකු නොවෙමි, තවද, මා වඳින්නා (අල්ලාහ්) ඔබද වඳින්නේ නැත. ඔබලාට ඔබලාගේ මාර්ගය (ධර්මය) ; මට මගේ මාර්ගය (ධර්මය)(වේ).


'B'

පසුව, 'B' පින්තූරයේ මෙන් 'අල්ලාහු අක්බර්' කියමින් රුකූඋ කළ යුතුයි. රුකූවේදී

سُبْحَانَ رَبِّيَ الْعَظِيْمِ

යනු වාක්‍යය 03 වරක් කිව යුතුයි.

'**සුබ්හාන රබ්බියල් අලීම්**'

**පරිවර්තනය** : "අති ශ්‍රේෂ්ඨ මගේ අධිපති ඉතාමත් පරිශුද්ධ වන්තය."

මෙසේ රුකූඋ කිරීමෙන් පසු 'C' පින්තූරයේ පරිදි

سَمِعَ اللّٰهُ لِمَنْ حَمِدَهُ ط

යනු කියමින් කෙළින් සිටිය යුතුය.

'**සමිඅල්ලාහු ලිමන් හමිදහ්**'


'C'

**පරිවර්තනය** : "අල්ලාහ්, තමන්ව පැසසුම් කරන්නාට සවන් දෙයි."

කෙළින් සිටගත් පසුව رَبَّنَا لَكَ الْحَمْدُ ط

'**රබ්බනා ලකල් හම්දු**' යනු කිව යුතුය.

**පරිවර්තනය** : "යා රබ් ! සියලු ප්‍රශංසා ඔබටම හිමිය."

පසුව, 'අල්ලාහු අක්බර්' යනු කියමින් "D" පින්තූරයේ මෙන් සුජූද් කළ යුතුය. එනම් නලළ බිම තබා නැමිදිය යුතුයි.

එවිට

سُبْحَانَ رَبِّيَ الْأَعْلَى


'D'

'**සුබ්හාන රබ්බියල් අලා**' යනු 03 වරක් කිව යුතුයි.

**පරිවර්තනය :** 'ඉතාමත් උසස් වූ මගේ අධිපති පරිශුද්ධ වන්තය.'

'E'



පසුව 'E' පින්තූරයේ මෙන් සුජුදයෙන් නැගිට ඉඳගෙන

رَبِّ اغْفِرْلِي 'රබ්බිඃෆිර්ලි' යනු කිව යුතුයි.

**පරිවර්තනය :** 'මගේ අධිපතිතුමනි ! මට සමාවන්න.'

'F'



පසුව 'F' පින්තූරයේ ඇත්තාසේ නැවතත් සුජුදයට ගොස් 'සුබ්හාන රබ්බියල් අඃලා' යනු 03 වරක් කියා 'G' පින්තූරයේ මෙන් කෙළින් සිටගත යුතුයි.


'G'



මේ වනතෙක් කියනු ලැබූ ක්‍රමයට අයත් සැවොම එකතුව 'රකඅත්' එකක් ලෙස සැළකේ.

මෙවැනි 'රකඅත්' 02 ක් ෆජ්ර් සලාතයෙහිත්, 04 ක් ලුහර් හිදීත්, 04 ක් අසර් හිදීත්, 03 ක් මඃරිබ් හිදීත්, 04 ක් ඉෂා හිදීත් කළයුතු වේ. එසේ කිරීමෙන් සලාතය සම්පූර්ණ වේ.

'H



**තෂහ්හුද්**

اَلتَّحِيَّاتُ لِلَّهِ وَالصَّلَوَاتُ وَالطَّيِّبَاتُ، اَلسَّلَامُ عَلَيْكَ أَيُّهَا النَّبِيُّ وَرَحْمَةُ اللَّهِ
وَبَرَكَاتُهُ، اَلسَّلَامُ عَلَيْنَا وَعَلَى عِبَادِ اللَّهِ الصَّالِحِيْنَ ○ أَشْهَدُ أَنْ لَا إِلَهَ إِلَّا اللَّهُ
وَأَشْهَدُ أَنَّ مُحَمَّداً عَبْدُهُ وَرَسُوْلُهُ.

අන්තිමට, 'H. පින්තූරයේ ඉඳගෙන සිටින ලෙස ඉඳ 'තෂහ්හුද් (අත්තහියියාත්)' කිව යුතුය. රක්අත් 02 කට පසු කුඩා ඉඳගැනීමේදී මෙපමණක් කිව යුතුය.

**'අත්තහියියාතු ලිල්ලාහි වස්සලවාතු, වත්තය්යිබාතු, අස්සලාමු අලෙයික අයියුහන් නබියියු වරහ්මතුල්ලාහි වබරකාත්තු හු අස් සලාමු අලෙයිනා වඅලා ඉබාදිල්ලාහිස් සාලිහීන්. අෂ්හදු අන්ලාඉලාහ ඉල්ලල්ලාහු වඅෂ්හදු අන්න මුහම්මදන් අබ්දුහු වරසූලුහු'**

**පරිවර්තනය :** සියලු සෙත් ශාන්ති, ගෞරව සම්මාන සහ සලවාත් හිමි අල්ලාහ්ටය. වක්තෘවරයාණෙනි ! අල්ලාහ්ගේ දයාව, ආශීර්වාදය සහ සාමය ඔබතුමාණන්ට ලැබේවා. අල්ලාහ්ගේ දැහැමි මෙහෙකරුවන් සහ අප සැම වෙත සාමය ලැබේවා. අල්ලාහ් හැර වැඳුම් පිදුම් කිරීමට වෙන දෙවිකෙනෙකු නැති බවත්, මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ වහලෙකු හා වක්තෘවරයෙකු බවත් මම සාක්ෂි දරමි.

සලාතය නිම කිරීමට එන කෙනෙකු ඉහත සඳහන් අත්තහියියාතය සමග පහත සඳහන් සලවාතය හා ප්‍රාර්ථනාව ද කීම වැදගති.

**සලවාත්**

اَللّٰهُمَّ صَلِّ عَلٰى مُحَمَّدٍ وَعَلٰى آلِ مُحَمَّدٍ
كَمَا صَلَّيْتَ عَلٰى اِبْرَاهِيْمَ وَعَلٰى آلِ اِبْرَاهِيْمَ
وَبَارِكْ عَلٰى مُحَمَّدٍ وَعَلٰى آلِ مُحَمَّدٍ كَمَا بَارَكْتَ
عَلٰى اِبْرَاهِيْمَ وَعَلٰى آلِ اِبْرَاهِيْمَ اِنَّكَ حَمِيْدٌ مَجِيْدٌ

**අල්ලාහ්හුම්ම සල්ලි අලා මුහම්මදින් වආලා ආලි මුහම්මදින් කමා සල්ලයිත්ත අලා ඉබ්රාහීම වඅලා ආලි ඉබ්රාහීම වබාරික් අලා මුහම්මදින් වආලා ආලි මුහම්මදින් කමා බාරක්ත අලා ඉබ්රාහීම වආලා ආලි ඉබ්රාහීම ඉන්නක්ක හමීදුම් මජීද්.**

**පරිවර්තනය :** "යා අල්ලාහ් ! ඔබේ සාමයත් ආශීර්වාදයත් මුහම්මද් (සල්) තුමා හා එතුමාණන්ගේ අනුගාමිකයන් වෙත පහළ කරන්න. ඉබ්රාහිම් (අලෙයි) තුමා සහ එතුමාගේ අනුගාමිකයන් වෙත ඔබේ සාමය හා ආශීර්වාදය පහළ කළාක් මෙන් මුහම්මද් (සල්) තුමා වෙතද ඔබේ ආශීර්වාදය පහළ කරන්න. ඔබ ඉබ්රාහිම් (අලෙයි) තුමා සහ එතුමාගෙන් පැවත එන්නන්ට ආශීර්වාද කළාක් මෙන් ඔබද අතිවිශිෂ්ට වැනුමකට භාජනය වනු ඇත.

**දුආ - ප්‍රාර්ථනාව**

اَللّٰهُمَّ اغْفِرْ لِيْ مَا قَدَّمْتُ وَمَا
اَخَّرْتُ وَمَا اَسْرَرْتُ وَمَا اَعْلَنْتُ وَمَا اَسْرَفْتُ وَمَا
اَنْتَ اَعْلَمُ بِهِ مِنِّيْ اَنْتَ الْمُقَدِّمُ وَاَنْتَ الْمُؤَخِّرُ
لَا اِلٰهَ اِلَّا اَنْتَ سُبْحَانَكَ اِنِّيْ كُنْتُ مِنَ الظَّالِمِيْنَ
اَللّٰهُمَّ اِنِّيْ اَعُوْذُ بِكَ مِنْ عَذَابِ الْقَبْرِ وَمِنْ
عَذَابِ النَّارِ وَمِنْ فِتْنَةِ الْمَحْيَا وَالْمَمَاتِ وَمِنْ
فِتْنَةِ الْمَسِيْحِ الدَّجَّالِ


اَللّٰهُمَّ اِنِّيْ ظَلَمْتُ نَفْسِيْ ظُلْمًا كَثِيْرًا
وَلَا يَغْفِرُ الذُّنُوْبَ اِلَّا اَنْتَ فَاغْفِرْ لِيْ
مَغْفِرَةً مِّنْ عِنْدِكَ وَارْحَمْنِيْ اِنَّكَ
اَنْتَ الْغَفُوْرُ الرَّحِيْمُ

**අල්ලාහුම්ම(ඃ)ෆිර්ලි මා කද්දම්ත්තු වමා අහ්(ඃ)හර්තු වමා අස්රර්ත්තු වමා ඇලත්ත්තු වමා අස්රෆ්තු වමා අන්ත ඇලමු බිහී මින්නි අන්තල් මුකද්දිමු ව අන්තල් මුඅහ්(ඃ)හිරු ලාඉලාහා ඉල්ලා අන්ත සුබහානක ඉන්නි කුන්තු මිනල් ලාලිමීන්. අල්ලාහුම්ම ඉන්නි අඌදුබික මින් අදබිල් කබ්රි වමින් අදබින් නාරි වමින් ෆිත්නත්තිල් මහ්යා වල් මමාති වමින් ෆිත්නත්තිල් මසීහිද් දජ්ජාලි අල්ලාහුම්ම ඉන්නි ලලම්ත්තු නෆ්සී ලුල්මන් කදිරන් වලා ය(ඃ)ෆිරුද් දුනූබ ඉල්ලා අන්ත්ත ෆ(ඃ)ෆිර් ලි ම(ඃ)ෆිරතන් මින් ඉන්දික්ක වර්හම්නී ඉන්නක අන්තල්(ඃ)ගෆූරුර් රහීම්.**

**පරිවර්තනය** : අහෝ අල්ලාහු තආලා අතීතයේ සහ වර්තමානයේ, රහසේ හෝ එළිපිට හෝ මවිසින් කරන ලද ඔබ දන්නා සියලු පාපයනට සමාවන්න. ආරම්භය සහ අවසානය ඔබ සතුය. ඔබ හැර නැමදුම් කිරීමට සුදුස්සෙක් නැත. මම ඔබ සුවිශුද්ධ කරමි. සැබවින්ම මම පව්කාරයෙක් වීමි. අහෝ, අල්ලාහු තආලා, මිණීවළෙහි සහ අපායේ දඬුවම් වලින්ද ජීවිතයේ සහ මරණයේ දුකින්ද තොරවීමට ඔබේ පිහිට සොයමි. අහෝ අල්ලාහු තආලා මම විශාල අනතුරක් කර ගෙන ඇත්තෙමි. ඔබ හැර කිසිවකුට මගේ පාපයනට සමාව දිය නොහැක. ඒ නිසා මට සමාව දෙන්න. සමාව ඔබ සතුය. සමාව දෙන සානුකම්පිතයා ඔබය.

අවසානය වශයෙන් I පින්තූරයේ ඉඳ
මුහුණ පමණක් හරවා

I



اَلسَّلَامُ عَلَيْكُمْ وَرَحْمَةُ اللّٰهِ

**'අස්සලාමු අලෛයිකුම් වරහ්මතුල්ලාහ්**

පළමුව දකුණු පැත්තට හා දෙවනුව වම් පැත්තට හැරී සලාම් කිව යුතුයි.

**පරිවර්තනය** :අල්ලාහ්ගේ ශාන්තිය, සාමය හා ආශිර්වාදය ඔබහට ලැබේවා!

**★★★★ මෙයින් සලාතය නිමවේ. ★★★★**

**සලාත් කිරීමෙන් පසුව පහත සඳහන් දෑ පිළිවෙලට කළ යුතුයි.**

1. أَسْتَغْفِرُ اللّٰهَ ○ أَسْتَغْفِرُ اللّٰهَ ○ أَسْتَغْفِرُ اللّٰهَ ○

2. اَللّٰهُمَّ أَنْتَ السَّلَامُ وَمِنْكَ السَّلَامُ تَبَارَكْتَ يَا ذَا الْجَلَالِ وَالْإِكْرَامِ ○

1. **"අස්තග්ෆිරුල්ලාහ්"** - (තුන් වරක්)
(යා අල්ලාහ් ! මට සමාවන්න !)

2. **අල්ලාහුම්ම අන්තස් සලාමු වමින්කස් සලාමු තබාරක්ත යාදල් ජලාලි වල් ඉක්රාම්.** (එක් වරක්)
(යා අල්ලාහ් ! ඔබ ශාන්තිය ලැබූ කෙනෙක් ය. ශාන්තිය ඔබටමය හිමිවන්නේ. ඔබ භාග්‍යවන්ත වෙයි. ප්‍රශංසාව හා කීර්තිය ඔබ සතුය.)

اللَّهُمَّ أَعِنِّي على ذِكْرِكَ وَشُكْرِكَ وَحُسْنِ عِبَادَتِكَ ○

(එක් වරක්)

**"අල්ලාහුම්ම අඉන්නී අලා දික්රික්ක ව සුක්රික්ක වහුස්නි ඉබාදතික්."**

(යා අල්ලාහ් ! සැම විටම ඔබගේ මතකය ඇතිව සිටීමට මට උදව් කරන්න. තවද, ඉතාමත් හරි විදිහට (ක්‍රමයට) ඔබට ස්තුතිවන්ත වීමටත්, වැඳුම් පිදුම් කිරීමටත් මට උදව් කරන්න.)

لَا إِلَٰهَ إِلَّا اللَّهُ وَحْدَهُ لَا شَرِيكَ لَهُ لَهُ الْمُلْكُ وَلَهُ الْحَمْدُ وَهُوَ عَلَىٰ كُلِّ شَيْءٍ قَدِيرٌ ط

اَللَّهُمَّ لَا مَانِعَ لِمَا أَعْطَيْتَ وَلَا مُعْطِيَ لِمَا مَنَعْتَ وَلَا يَنْفَعُ ذَا الْجَدِّ مِنْكَ اَلْجَدُّ.

**"ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්ද හු ලා සරික්කලහු. ලහුල් මුල්කු වලහුල් හම්දු වහුව අලා කුල්ලි සයිඉන් කදිර්. අල්ලාහුම්ම ලා මානිඅ ලිමා ඇතයිත්ත වලා මුඃතිය ලිමා මනඃත්ත වලා යන්පඋ දල් ජද්දි මින්කල් ජද්දු."**

**පරිත්තය :** අල්ලාහ් හැර වැඳුම් පිදුම් කිරීමට වෙන කිසිවෙකු නැත. ඔහු ඒකීයකි. ඔහුට සමානව කිසිවෙකු නැත. ස්වාධිපත්‍යය හා ප්‍රශංසාව ඔහුට පමණක් හිමිය. සෑමයකම ආධිපත්‍යය හා සම්පූර්ණ බලය ඔහු සතුය. යා අල්ලාහ් ! ඔබ දුන් දෙය කවුරු විසිනුත් නවත්වාලීමට බැරිය. ඔබ නුදුන් දේ කවුරු විසිනුත් දෙන්නත් බැරිය. පොහොසතාගේ සැප සම්පත් ඔබගේ දඬුවම් වලින් ඔහුව බේරා ගැනීමට ඔහුට ප්‍රයෝජනය වන්නේද නැත.

| | | | |
|---|---|---|---|
| 1. | **සුබ්හානල්ලාහ්** | سُبْحَانَ اللَّهِ | - 33 වරක් |
| 2. | **අල්හම්දුලිල්ලාහ්** | اَلْحَمْدُ لِلَّهِ | - 33 වරක් |
| 3. | **අල්ලාහු අක්බර්** | اَللَّهُ أَكْبَرُ | - 33 වරක් |

4. ලා ඉලාහ ඉල්ලල්ලාහු වහ්ද හු ලා සරික්කලහු. **ලහුල් මුල්කු** වලහුල් හම්දු වහුව අලා කුල්ලි සයිඉන් කදිර්.

لا إله إِلَّا اللهُ وَحْدَهُ لا شَرِيكَ لَهُ لَهُ الْمُلْكُ وله الحَمْدُ

وَهُوَ عَلَى كُلِّ شَيْءٍ قَدِير - එක් වරක්

● මින්පසුව තමන්ට උවමනා ප්‍රාර්ථනාවන් අල්ලාහ් වෙත යොමු කළ හැක. ●

# ජුම්ආ සලාතය

ජුම්ආ සලාතය වනාහි 'ෆර්ල්' නම් වූ අනිවාර්ය්‍ය නැමදුමකි. සතියකට වරක් සිකුරාද දිනයන් හි ඇති මෙම නැමදුමට 'කුත්බා' නම් වූ දේශනය ද අඩංගු වේ.

ඉස්ලාමික සමාජ ක්‍රමය තුළ ජුම්ආ සලාතයට හිමි තැන අසමානයඃ අති විශිෂ්ටය. සම්පූර්ණ සතියක කාලයක් තුළ මස්ජිද්වලත්, එළිමහන් ප්‍රදේශවලත් තවත් නොයෙකුත් ස්ථානයන්හි දීත් පස්වේල සලාතයෙහි යෙදී සිටියවුන් ජුම්ආ ව වෙනුවෙන් එක් තැනක රැස්කරනු ලබති.

එසේ රැස්කරනු ලැබුවන් සඳහා 'කුත්බා' නම් වූ දේශනය පවත්වනු ලබයි. එම කුත්බාවෙහි ඉතාමත් වැදගත් ඉස්ලාමික කරුණු ප්‍රකාශිත වෙයි. සර්ව බලධාරි අල්ලාහ්, ඔහුගේ වක්තෘවරයා වූ මුහම්මද් (සල්) තුමාණන්, ඔහු විසින් දෙනු ලැබූ ඉස්ලාමික ජීවිත සැලැස්මේ අවශ්‍යතාවය, මුස්ලිමුන්ගේ ප්‍රගතිය, පසුබැස්ම හා සමගිය යනාදී නොයෙකුත් දේ ගැන කුත්බාවෙහි කරුණු පහද දෙනු ඇත.

මෙවන් කරුණු අසා මහත් ප්‍රබෝධයට පත්වන මුස්ලිමුන් තමන්ගේ දුක් ගැහැට, උවමනාවන් අල්ලාහ් ඉදිරියේ තබා, ප්‍රාර්ථනා කිරීමෙන් යුතුව ජුම්ආ සලාතය ඉටු කරති.

සතිපතා කෙරෙන මෙම ආශ්චර්යමත් නැමදුම වූ ජුම්ආ සලාතය රක අත් දෙකකින් යුක්ත වුවකි. ස්ත්‍රීන්, වහලුන්, කුඩා ළමුන්, බරපතළ ලෙස ලෙඩවුවන් හා මගීන් හැර අන් සියලු මුස්ලිමුන්ම අනිවාර්ය්‍යයෙන් මෙම සලාතය ඉටුකළ යුතුය.

සමහරවිට, මෙම සලාතය ඉටුකිරීම අනිවාර්ය්‍ය නොවන්නෙක් මෙය ඉටුකරන්නේ නම් එයට අල්ලාහ්ගේ ත්‍යාගයන් ලැබෙනු ඇත. එසේ නැතිවිට ඔවුන් ලුහර් සලාතය නැමදීම අනිවාර්ය්‍ය වේ.

ජුම්ආ සලාතය අනිවාර්ය්‍යයෙන් ඉටුකළ යුත්තන් වැදිගත් කාරණාවක් නොමැතිව එය ඉටු නොකර සිටීම බලවත් පාපයකි. නබි (සල්) තුමාණන් එවැන්නන් කෙරෙහි තමන්ගේ දැඩි අප්‍රසාදය පළකර සිටියහ.

එතුමාණන් මෙසේ පැවසූහඃ

**"සලාතය මෙහෙයවීම සඳහා යමෙකු පත්කොට, ජුම්ආ සලාතය සඳහා නොපැමිණියන්ගේ නිවෙස්කරා මම ම ගොස්, එහි නිවැසියන් සිටියදීම එම නිවෙස්වලට ගිනි තැබීමට සිතමි."**

(මුස්ලිම්, අහ්මද් ග්‍රන්ථ ඇසුරෙනි.)

නැවත වරක් මෙසේ පැවසූහ:

"**කිසියම් පුද්ගලයෙකු නොකඩවා ජුම්ආ සලාතයන් තුනකට (3) සහභාගී නොවූයේ නම්, ඔහුගේ හදවතට අල්ලාහ් විසින් මුද්‍රා තබනු ඇත.**"

(අහමද්, තිර්මිදී, අබූදාවූද් ග්‍රන්ථ ඇසුරෙනි)

# ජුම්ආ සලාතය හා පවිත්‍රතාවය

ජුම්ආ දවසෙහි මුස්ලිමෙකු ඉතාමත් පිරිසිදුව තමන්ව තබාගැනීම සම්බන්ධව නබි (සල්) තුමාණන් කරුණු පැහැදිළිකර ඇත්තා හ. මුස්ලිමෙකු සෑම විටකම, සෑම අවස්ථාවකම පිරිසිදුව සිටිය යුතුය. එයිනුත්, විශාල ලෙස ජනයින් එක් රැස්වෙන ස්ථානයක අප ඉතාමත් පිරිසිදුව සිටීම අවශ්‍යමය යන්න සැමෝම පිළිගන්නවා ඇත.

නබි (සල්) තුමාණන් මෙසේ පැවසූහ:

"**ජුම්ආ දවසෙහි, පරිණත වූ සෑම කෙනෙකුටම නෑම හා මිස්වාක් කිරීම (දත් මැදීම) ද, හැකි තරම් සුවඳ ගල්වා ගැනීමද, ඉතාමත් වැදගත්ය.**"

(අබූදාවූද් ග්‍රන්ථය ඇසුරෙනි)

එතුමාණන් තවත් විස්තරාත්මකව මෙසේ පැවසූහ:

"**යමෙකු සිකුරුද දිනයෙහි නෑමෙන් තමන්ව සම්පූර්ණයෙන් පිරිසිදු කරගෙන, තෙල් හා සුවඳ ගල්වා, කල් වේලාව ඇතිව මස්ජිදයට ගොස් සෙසු අය තල්ලු නොකර, ඔවුනට හිරිහැර නොවන සේ (සිටිය යුතුය.) පසුව ඔහු (අනිවාර්යය නොවන) සලාතයන් ඉටුකර, සන්සුන්ව ඉඳ කුත්බා දේශනයට සවන් දෙන්නේ නම්, එම ජුම්ආ දිනයේ සිට ඊළඟ ජුම්ආ දිනය දක්වා වූ කාලය තුළ ඔහු අතින් සිදුවූ පාපයන්ට සමාව ලැබෙනු ඇත.**"

(බුහාරි ග්‍රන්ථය ඇසුරෙනි.)

# ජුම්ආ සලාතය සඳහා කල්වේලාවෙන් යෑම

ඉහත සඳහන් පරිදි පිරිසිදු වූ කෙනෙකු කල්වේලා ඇතිව ජුම්ආ සලාතය සඳහා යෑම නබි(සල්) තුමාණන් විසින් අගේකොට සළකනු ලැබ ඇත.

නබි (සල්) තුමාණන් පැවසූ බව අබූහුරෙයිරා (රලි) තුමා මෙසේ වාර්තා කරයි:

"**සිකුරාද දිනයන් හි මලාඉකාවරු, මස්ජිදයේ දොරටුව අසලට වී ජුම්ආ සලාතය සඳහා මස්ජිදයට පැමිණෙන්නන්ගේ නම් ඔවුන් එන පිළිවෙල අනුව සටහන් කරගනිති. පළමුවෙන් මස්ජිදයට පිවිසෙන කණ්ඩායමට ඔටුවෙක් කුර්බාන් දීමෙන් ලද ප්‍රමාණයට සමාන පිනක් ද, ඔවුන්ගෙන් පසුව මස්ජිදයට පිවිසෙන අයහට ගවයෙක් කුර්බාන් දීමෙන් ලද ප්‍රමාණයට සමාන පිනක් ද, ඔවුන්ගෙන් පසුව මස්ජිදයට පිවිසෙන අයහට බැටළුවෙක් කුර්බාන් දීමෙන් ලද ප්‍රමාණයට සමාන පිනක් ද, ඉන්පසුව (මස්ජිදයට)**

**පිවිසෙන අයහට ඔවුන් පැමිණෙන පිළිවල අනුව කුකුළෙක්, බිත්තරයක් දෙනු ලැබූ තරමක පිනක් ද ලබාගනු ඇත. මෙලෙස ඔවුනොවුන් මස්ජිදයට පිවිසෙන පිළිවෙල අනුව වර්ග කරනු ලැබේ. ඉමාම් කුත්බා දේශනය සඳහා (මස්ජිදයට) පිවිසෙනතෙක් මෙසේ මස්ජිදයට පිවිසෙන්නන්ගේ නම් සටහන් කරගත්නා මලාඉකාවරු, පසුව තමන්ගේ සටහන් පොත් වසාතබා කුත්බා දේශනයට සවන්දීමට වාඩිවෙති."**

(බුහාරි, මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)

මෙම නබි වදන සිතට ගෙන සෑම සිකුරාද දිනයකම ජුම්ආ සලාතය සඳහා අප සෑමෝම වේලාසනයෙන්ම මස්ජිදයට යෑම වැදගත්ය. එහි යන අප හැකි තරම් අනිවාර්ය්‍ය නොවන සලාතයන් ඉටුකිරීමෙන් පසුව, ඉමාම් කුත්බා දේශනය පැවැත්වීමට එනතෙක් අල්කුර්ආනය කියවීම, අල්ලාහ් මෙනෙහි කිරීම, ඔහුට ප්‍රශංසා කිරීම, මුහම්මද් නබි (සල්) තුමාණන් කෙරෙහි සලවාත් කීම යනාදී උතුම් කාය්‍ර්‍යයන් හි යෙදී සිටීම වැදගත්ය: මෙම කාය්‍ර්‍යයන් හි යෙදී සිටීමට නබි වදන් හි සාධක ඇත.

# කුත්බා දේශනයට සවන්දීම

කුත්බා දේශනය ආරම්භ වූ වහාම මස්ජිදයෙහි සිටින අය සන්සුන්ව එයට සවන් දිය යුතුය: 'එයින් ලැබෙන වැදගත් කරුණු අනුව ජීවිතය හැඩගස්වා ගතයුතුය.' යන අදහසින් එයට ඉතාමත් සැලකිලිමත්ව සවන් දීම අවශ්‍යය. තවද කුත්බා දේශනය පවත් වන අවස්ථාවෙහි යමෙකු මස්ජිදයට ඇතුල් වන්නේ නම් ඔහු අනිවාර්ය්‍ය නොවන සලාත් රකඅත් දෙකක් ඉටුකිරීමෙන් පසුව වාඩිවී කුත්බා දේශනයට සවන් දිය යුතුයි.

නබි(සල්) තුමාණන් කුත්බා දේශනය පවත්වද්දි පහත සඳහන් ලෙස පැවසූ බව ජාබිර් (රලි) තුමා වාර්තා කරයි:

**"ඉමාම් කුත්බා දේශනය පවත්වන අවස්ථාවෙහි යමෙකු ජුම්ආ සලාතය වෙනුවෙන් මස්ජිදයට ඇතුල් වුවහොත්, ඔහු රකඅත් දෙකක් (අනිවාර්ය්‍ය නොවන - තහිය්‍යතුල් මස්ජිද් නැමදුම) නැමදිය යුතුය: එය දීර්ඝ නොකළ යුතුය."**

(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

ජාබිර්(රලි) තුමා වාර්තා කරන තවත් නබි වදනක් මෙසේය:

**"වරක් නබි (සල්) තුමාණන් කුත්බා දේශනය කරන අවස්ථාවෙහි යමෙකු ජුම්ආ සලාතය සඳහා මස්ජිදයට ආවේය. නබි (සල්) තුමා "ඔබ සලාත් ඉටුකළේද?" යන්න විමසූහ. එයට, ඔහු "නැත !" යන පිළිතුරු දුන්නේය. එවිට නබි (සල්) තුමාණන් "නැගිට සලාතය ඉටුකරන්න ! " යයි කියා සිටියහ.**

(බුහාරි, මුස්ලිම්, අබූදාවූද්, තිර්මිදී ග්‍රන්ථ ඇසුරෙනි)

අබූ කතාද (රලි) තුමා වාර්තා කරන තවත් නබි වදනක් මෙසේය:

"යම්කිසිවිටක ඔබගෙන් කෙනෙක් මස්ජිදය තුලට පිවිසෙන්නේ නම්, එම තැනැත්තා රකඅත් දෙකක සලාතය ඉටු නොකර වාඩි නොවිය යුතුයි." යනු නබි (සල්) තුමාණන් පැවසූහ."

(බුහාරි, මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි.)

# ජුම්ආ සලාතය

කුත්බා දේශනය නිම වූ පසුව ජුම්ආ සලාතය පටන් ගැනේ. එය රකඅත් දෙකකින් වූ අනිවාර්‍ය (ෆර්ල්) සලාතයකි.

ජුම්ආ සලාතයේ එක් රකඅතයක් නිම වූ අවස්ථාවෙහි යමෙකු මස්ජිදයට පිවිසෙන්නේ නම්, ඔහු එක් රකඅතයක් ඉමාම් සමග නැමදිය යුතුයි. පසුව, ඉමාම් සලාම් දීමත් සමඟ නැගිට අනෙක් රකඅත නැමදීමෙන් ජුම්ආ සලාතය සම්පූර්ණ කළයුතුය.

ජුම්ආ සලාතය සම්පූර්ණයෙන්ම නිම වූ කල, මස්ජිදයට පිවිසෙන්නෙක් ලුහර් සලාතය නැමදීම අවශ්‍යය. ලුහර් සලාතය රකඅත් සතරකින් (4) සමන්විත බව කවුරුත් දනියි. නමුත්, මෙම තැනැත්තා ජුම්ආ සලාතය පැහැර හැරිය වැරැද්ද කළ අයෙක් බව වටහාගත යුතුය.

# ෆර්ල්වලට පසුව සුන්නත්

ජුම්ආ සලාතය අනිවාර්‍යය. එය ඉටුකිරීමෙන් පසුව අනිවාර්‍යය නොවන (සුන්නත්) සලාත් දෙකක්, සතරක් හෝ හයක් ඉටුකිරීම නබි (සල්) තුමාණන්ගේ ආදර්ශමත් ක්‍රියාවකි.

මේ ගැන ඇති නබි වදන් මෙසේය:

ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරයි:

**"නබි (සල්) තුමාණන් ජුම්ආ සලාතයට පසුව (තම) නිවසට ලඟාවනතෙක් (වෙන කිසියම් සලාතයක්වත් ) නැමදූවේ නැත. (තම නිවසට) ගිය විට රකඅත් දෙකක් නැමදූහ."**

(බුහාරි, මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)

අබූ හුරෙයිරා (රලි) වාර්තා කරයි:

**"ඔබලාගෙන් යමෙකු ජුම්ආ සලාතයට පසුව සලාත් ඉටුකරන්නේ නම්, හෙතෙම රකඅත් සතරක් ඉටුකළ යුතුය."**

(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

අතාඋ වාර්තා කරයි:

**"අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රලි) තුමා යම් අවස්ථාවක මක්කාවෙහි ජුම්ආ සලාතය ඉටුකළහොත්, (එතුමා සලාත් ඉටුකළ ස්ථානයේ සිට) මදක් ඉදිරියට ගොස් රකඅත් දෙකක් සලාත් කරයි: පසුව, තවත් මදක් ඉදිරියට ගොස් රකඅත් සතරක් සලාත් කරයි. (නමුත්) එතුමා යම් අවස්ථාවක මදීනාවෙහි**

ජුම්ආ සලාතය ඉටුකළහොත්, ඉනික්බිතිව, නිවසට යනතෙක් මස්ජිදයෙහි සලාත් ඉටුනොකරයි. නිවසෙහි රකඅත් දෙකක් සලාත් කරයි. මේ ගැන, "ජුම්ආ සලාතයට පසුව මස්ජිදයෙහි සලාත් ඉටුනොකළේ මන්ද?" යනු විමසූ විට එතුමාගේ පිළිතුර වූයේ "මෙයයි නබී (සල්) තුමාණන්ගේ ක්‍රියා මාර්ගය !" "යනුවෙන්" ය.

මෙම කරුණු අනුව ජුම්ආ සලාතයෙන් පසුව අනිවාර්ය්‍ය නොවන සලාතයන් ඉටුකිරීමේ වැදගත්කම මනාව පැහැදිලි වන්නේය.

ජුම්ආ සලාතය හා සම්බන්ධව අප ගෙන දක්වා ඇති කරුණු සැමයකම වැදගත්කම හා අවශ්‍යතාවයන් හොඳින් දැනගැනීම ත්, ඒ අනුව ඒවා පිළිපැදීමත් අල්ලාහ්ගේ තෘප්තිය ලබාදෙන ක්‍රියාවන් ය: එමෙන්ම දෙලොව සෙතටත් මග පාදන දේව ඇඳිහිලි ය.

අල්ලාහ් මෙසේ කියයි:

"විශ්වාසවන්තයෙනි ! ජුම්ආ දිනයෙහි සලාත් කිරීම සඳහා ඔබ කැඳවනු ලැබුවහොත්, වෙළඳම නවත්වා, අල්ලාහ් මෙනෙහි කිරීමට (මස්ජිදයට) වහාම යන්න. ඔබ ඥානවන්ත නම් මෙය ඔබට ඉතාමත් උතුම් (බව හැඟෙන්නේ) ය. තවද, (ජුම්ආ) සලාතය ඉටුකළ පසු (මස්ජිදයෙන් පිටවී) භූමියේ විසිරී ගොස් අල්ලාහ්ගේ පරිත්‍යාගයන් සොයාගන්න. තවද, ඔබ ජය ලබාගැනීම සඳහා වැඩි වැඩියෙන් අල්ලාහ් මෙනෙහි කරන්න."

(අල් කුර්ආන් 62:9,10)

# ජමාඅත්* සලාතය

මේ කාලයේ නොයෙකුත් මුස්ලිමුන් සලාතය ජමාඅත් ව ඉටුකිරීමෙහි සැලකිලිමත් නොවෙති. මොවුන්ගේ මෙම අනුචණ ක්‍රියාවට සමහර උගතුන්ගේ ප්‍රකාශිත අදහස් කාරණාවන බව මම දනිමි, මෙම නිසා, මෙය කෙතරම් වැරදි ක්‍රියාවක්ද යනු පහදදීම මා සතු වගකීමක් බව මම විශ්වාස කරමි.

අල්ලාහ්, යමක් තම කුර්ආනයෙන් උතුම් බව කියා, ශුද්ධ වූ මුහම්මද් (සල්) නබි තුමාණන් විසින් ක්‍රියාවෙහි යෙදුවේ නම් එය වෙන කිසිම මුස්ලිමෙකු විසින් ප්‍රතික්ශේප කළ නොහැක. එසේ කිරීම බලවත් වරදකි.

අල්ලාහ්, තම ග්‍රන්ථයේ අනේක තැන්වල සලාතයේ වැදගත්කම ගැනත්, එය ඉතාමත් යහපත් අඳුමට එක් රැස්ව ඉටුකිරීමේ වැදගත්කම ගැනත් කියා ඇත. තවද, කම්මැලිකම නිසාම එය නිසි පිළිවෙලට ඉටු නොකිරීම කුහකයින්ගේ ලක්ෂණයක් බවත් ඔහු කියයි.

අල්ලාහ් කියයි:

**"ඔබගේ සලාතයන් හි බොහෝ සැලකිලිමත් වන්න. විශේෂයෙන්ම විශිෂ්ඨ ගුණයන්ගෙන් යුතුව සලාතය ඉටුකිරීමට විශේෂ අවධානය යොමු කරන්න. තවද, භක්තිමත් සේවකයන් මෙන් අල්ලාහ් ඉදිරියේ සිටගන්න."**

(අල් කුර්ආන් 2:238)

සලාතය වැදගත් බව නොසිතන්නන් හා තම සහෝදරයන් සමග එක්වී ජමාඅත්ව සලාතය ඉටු නොකරන්නන් "සලාතය උතුම්කොට සළකන්නේය; එය නියම පිළිවෙළට ඉටුකරන්නේය" යනු කෙසේ අදහස් කරමුද?

අල්ලාහ් කියන්නේ මෙසේය:

**"සලාත් ස්ථාවර කොට, සකාත් ගෙවා රුකූඋ (නමස්කාර) කරන්නන් සමඟ මා ඉදිරියේ රුකූඋ (නමස්කාර) කරන්න."**

(අල් කුර්ආන් 2:43)

මෙම කුර්ආන් වාක්‍යය සලාත් කරන්නන් සමග සාමූහිකව සලාත් කිරීමේ අවශ්‍යතාවය මනාව පැහැදිලි කර සිටියි. සලාතය කෙසේ හෝ ඉටුකිරීම පමණය අපකළයුත්තේ නම් මෙම වාක්‍යයේ අවසානයේ "රුකූඋ (නමස්කාර) කරන්නන් සමඟ එක්වී රුකූඋ (නමස්කාර) කරන්න." යනු කීමට අවශ්‍යයක් නොමැත.

---

★ "ජමාඅත්" - මෙම වචනයෙහි තේරුම වනාහි "සමූහය" "එක්රැස්ව යමක් කිරීම" නම්වේ. "ජමාඅත් සලාතය" යනුවෙන් කියවෙන්නේ "එක් රැස්ව (සලාත්) නැමදීම ඉටු කිරීම" යන්නය.

★★ සලාතය එක් රැස්ව කිරීමේ අවශ්‍යතාවය ගෙනදක්වා, අස්සෙයික් අබ්දුල් අසීස් ඉබ්නු අබ්දුල්ලාහ් ඉබ්නු බාස් තුමා විසින් නිකුත් කළ (ෆත්වා) තීන්දුව.

අල්ලාහ් මෙසේ කියයි:

**"(නබිතුමාණෙනි ! සටන් පෙරමුණේදී) ඔවුන් සමඟ ඔබ සිටියදී ඔවුන්ගේ සලාතය ඉටුකරලීමට ඔබ (ඉමාම් වශයෙන්) සිටින්නේ නම්, ඔවුන්ගෙන් එක් කණ්ඩායමක් තම ආයුධ සහිතව ඔබ සමඟ සලාත් කළ හැක. ඔවුන් ඔබ සමඟ සජ්දා කර (සලාතය) නිමකලාට පසුව, ඔවුන් (එතැනින් ඉවතට ගොස්) ඔබගේ පිටු පස (සිට ඔබව රැකගත යුතුයි.). එවිට, සලාත් නොකර සිටි අනෙක් කණ්ඩායම අවුත් ඔබ සමඟ සලාතය ඉටු කළ හැක. එවිට ඔවුනුත් තම තමන්ගේ ආයුධ සහිතව සාවධානව සිටිය යුතුයි."**

(අල් කුර්ආන් 4:102)

සටන් පෙරමුණේ දී පවා සලාතය එක් රැස්වී ජමාඅත් ව ඉටුකළ යුතු බව අල්ලාහ් අණකරන්නේ නම් සාමාන්‍ය කාලයන්හි එය එක්රැස්වී ජමාඅත්ව ඉටුකිරීම කෙතරම් වැදගත්ය යනු අප කල්පනා කළයුතුයි. එක් රැස්වී සලාතය ඉටුකිරීම අතහැරීමට යමෙකුට අවසර දෙන්නේ නම්, එසේ දිය යුත්තේ සටන් පෙරමුණේ තම සතුරන්ගෙන් කොයි මොහොතේ හෝ ගැටුමක් ඇති වේදෝ යනු සිටින යුද්ධ සෙබළුන්ටය. නමුත්, ඔවුනට පවා මෙම අවසරය නොදීම නිසා, සලාතය ජමාඅත් ව ඉටුකිරීම කෙතරම් වැදගත්ද යන්න සිතාබැලිය හැක. මෙයින් පෙනීයන්නේ කිසිම කෙනෙකුට සලාතය ජමාඅත්ව ඉටුකිරීම පැහැර හැරීමට පුළුවන්කමක් නැති බවය.

නබි (සල්) තුමාණන් මෙසේ පැවසූ බව අබූ හුරෙයිරා(රළි) තුමා වාර්තා කරයි.

**"මම කෙනෙකු පත් කර, (ඔහු) සලාතය සඳහා ඉකාමත් කීමෙන් පසුව, මිනිසුන් සඳහා සලාතය ඉටු කරලීමටත් කෙනෙකු පත්කිරීමෙන් පසුව, දරමිටි රැගත් මිනිසුන් කැඳවාගෙන ගොස් සලාතයට නොපැමිණි අයගේ නිවෙස්වලට ගිනි තැබීමට මම අධිෂ්ඨාන කරමි.** (බුහාරි, මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙනි)

තවද, අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද්(රළි) තුමා මෙසේ පවසයි:

**"අප අතර වූ රෝගීන් හා කුහකයින් හැර වෙන කවුරුන් හෝ සලාතයට පැමිණීමට පසුබට නොවන බව ඔබට බැලිය හැක. (සමහර විට) රෝගීන් පවා දෙදෙනෙකු අතර (ඔවුන්ගේ උදව් ඇතිව) සලාතයට එම ඔබ දකින්නට ඇත. නියත වශයෙන් නබි(සල්) තුමාණන් අපහට යහමඟ පෙන්වා දුන්සේක. 'අදාන් ශබ්දය නැගෙන මස්ජිද් හි සලාතය (සාමූහිකව) ඉටුකිරීම (එම) යහමඟට එකඟ වූවක් වේ.'"** (මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

අබ්දුල්ලාහ් ඉබ්නු මස්ඌද්(රළි) තුමා මෙසේද පවසයි:

**"කවුරුන් හෝ හෙට (එළොව) සම්පූර්ණ මුස්ලිමෙකු ලෙස අල්ලාහ් මුණගැසීමට කැමැති වන්නේද, ඔවුන් සලාතයන් ඒ සඳහා කැඳවීම් කරන ස්ථානයන්හි නිසිලෙස ඉටුකිරීම වැදගති. නියත වශයෙන්, අල්ලාහ් ඔබගේ**

**නබිතුමාට යහමග පෙන්වාදී ඇත. සලාතයද එම යහමගට එකහවූවකි. සලාතය ඉටුකිරීමෙහි (කම්මැලි වී) පසුබට වන්නන් ලෙස ඔබද එම සලාතය නිවෙස් වල ඉටුකරන්නේ නම් ඔබ, ඔබගේ නබිතුමා පෙන්වූ මාර්ගය අතහැර ඇති බව (එයින් පෙනීයයි.) ඔබ ඔබගේ නබිතුමාගේ සුන්නාව (ආදර්ශය) අතහැරියේ නම් ඔබ වැරදි මාර්ගයේ යන්නේය (යනු එහි තේරුමය). කවුරුන් හෝ වේවා පිළිවෙලට වුළු (පිරිසිදු) කර, මස්ජිද්වලින් (කොයි) එකකට හෝ යන්නේ නම්, ඔහු පයින් යන එක් එක් අඩියට අල්ලාහ් එක් එක් පිනක් ලියන්නේය. (එලොව) ඔහුගේ තත්වය එකකින් උසස් කරන්නේය: (ඔහුගේ) එක් පවක් මකන්නේය. අප අතර කුහකයන් හැර අන් කිසිවෙකු සලාතය ඉටුකිරීමට පසුබට වන්නේ නැත. සමහරු දෙදෙනෙකුගේ උදව් ඇතිව සලාතයට ගෙන එනු ලැබ පේලියේ තබනු ඇත."** (මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

අබූ හුරෙයිරා(රළි) තුමා මෙසේ වාර්තා කරයි:

**"එක් අන්ධ (මුස්ලිමෙක්) නබි(සල්) තුමාණන් ලඟටවිත් 'යා රසූලුල්ලාහ්! මා මස්ජිදයට කැඳවාගෙන ඒමට කවුරුත් නැත.(එමනිසා) මගේ නිවසෙහිම සලාතය ඉටුකිරීමට මට අවසර ඇත්ද?' යනු විමසුවේය. එයට නබි(සල්) තුමාණන්, 'සලාතය සඳහා කැඳවන (අදානයේ) ශබ්දය ඔබට ඇසේද?' යනු ඇසූහ. 'ඔව්' යනු ඔහු පිළිතුරු දුන්නේය. 'එසේ නම් ඔබ අනිවාර්‍යයෙන්ම මස්ජිදයට ආයුතුය' යනු නබි(සල්) තුමාණන් පැවසූහ."**

(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

මෙලෙස, සලාතය එක් රැස්ව ඉටුකිරීම ගැනත්, එය මස්ජිදයෙහි ඉටුකළ යුතුව යන්න ගැනත් අප හට අණ කරන නබි වදන් රාශියක් ඇත.

එමනිසා, අල්ලාහ්ට හා ඔහුගේ නබි තුමාණන්ට අවනතව ක්‍රියා කිරීම සෑම මුස්ලිමෙකු විසින්ම කළයුත්තකි. තවද, මේ ගැන තම දූ දරුවන්, පවුලේ සාමාජිකයින්, අවට වෙසෙන්නන්, නෑදෑ හිතමිතුරන් වැනි සෑම දෙනෙකුටම උපදෙස් දීම අවශ්‍යය. එමෙන්ම, අල්ලාහ් හා ඔහුගේ නබි තුමාණන් 'නොකළ යුතුය' යනු කියා ඇති දෙයින් වැලකී සිටින අතර සලාතය ඉටුකිරීමෙහි කම්මැලි වීමද අත්හැරිය යුතුය. ඇත්ත වශයෙන්ම මෙවැනි වැරදි ක්‍රියා අල්ලාහ් වර්ණනා කළ කුහකයන් සතු ගති ගුණවලට සමාන බව කිවහැක.

අල්ලාහ් මෙසේ කියයි:

**"නිශ්චය වශයෙන්ම, මෙම කුහකයින් අල්ලාහ් වංචා කිරීමට සිතති. නමුත්, අල්ලාහ් ඔවුන් වංචා කරන්නේය. සලාතයට ඔවුන් නැගී සිටියදී, උනන්දුවක් නොමැතිව නැගී සිටියි. මිනිසුන්ට (තමන් සලාත් කරන්නන් බව) පෙන්වීමට (එසේ සිටියි), තවද, ඉතාමත් සුළු වශයෙන් හැර ඔවුන් අල්ලාහ් මෙනෙහි කරන්නේ නැත. මෙම කුහකයින් විශ්වාස වන්තයන් පැත්තේ නැත: විශ්වාසවන්තයන් නොවන අය පැත්තේද නැත. මේ දෙපැත්ත අතර ඔවුන් අවිනිශ්චිතව වැනෙමින් සිටියි. අල්ලාහ් විසින් නියම මාර්ගයෙන් ඈත් කරනු**

ලැබූ තැනැත්තා හට (නබි තුමාණෙනි ! ) ඔබ යම්කිසි මාර්ගයක් ලබාගනු නොමැත."

(අල් කුර්ආන් 4:142,143)

සලාතය එක්රැස්ව ඉටුකිරීමට පසුබට වීම වනාහි එයින් සම්පූර්ණයෙන් ඉවත් වීමට තුඩු දෙන කරුණු වලින් එකකි. 'සලාතය අතහැරීම කුෆ්ර්' නම් වූවකි. එනම් අල්ලාහ් ප්‍රතික්ෂේප කිරීමත්, වැරදි මාර්ගයේ යෑමත් මෙයින් ඇතිවෙයි. ඉතික්බිතිව, ඉස්ලාමීක වටය නොහොත් සමූහයේ සම්බන්ධකමද නැතිවී යයි.

නබි (සල්) තුමාණන් මෙසේ පැවසූහ:

**"එක් මිනිසෙකුගේ (ඔහුගේ දේව විශ්වාසය හා) දේව ප්‍රතික්ෂේපය, (අල්ලාහ්ට) යමෙකු සමාන කිරීම යන්නත් අතර ඇති වෙනස සලාතය අත හැරීම වේ".**

(මුස්ලිම් ග්‍රන්ථය ඇසුරෙනි)

නබි(සල්) තුමාණන් මෙලෙස ද පැවසූහ:

**"අප හා ඔවුන් අතර ඇති ගිවිසුම නම් සලාතය වේ. කවරෙකු හෝ එය (සලාතය) අතහැරියේ නම් ඔහු (එම ගිවිසුම) ප්‍රතික්ෂේප කරන්නෙක් බවට පත්වෙයි."**

මෙලෙස සලාතයේ වැදගත්කම හා එය නිසිලෙස ඉටුකිරීම යනාදිය ගැන කුර්ආන් වාක්‍ය හා නබි වදන් රාශියක් ඇත. මෙනයින් යම් සත්‍යයක් හොඳාකාරව එළිවී, එයට අවශ්‍ය සාධක හා විස්තරයන් ද, නිසි ලෙස ලැබුණු විට, එය පිළිගැනීමෙහි වෙනත් අයගේ අදහස් හරස්වීම අනුමත නොකළ යුතුය.

අල්ලාහ් මෙසේ කියයි:

**"ඔබ අතර යමෙක් සම්බන්ධව භේදයක් මතුවූ කල්හි ඇත්ත වශයෙන්ම ඔබ අල්ලාහ් හා මරණින් මතු ජීවිතය විශ්වාස කරන්නෙකු නම්. එය අල්ලාහ් වෙත හා (ඔහුගේ) වක්තෘ වෙත පවරන්න. මෙයයි (ඔබගේ) ඉතාමත් උතුම්. යහපත් තීරණය වනු ඇත."**

(අල් කුර්ආන් 4:59)

තවද, අල්ලාහ් මෙසේ කියයි:

**"කවරෙකු හෝ එතුමා (වක්තෘවරයා) ගේ අණට කීකරු නොවන්නේ නම් එවැන්නන් තමන්හට බලවත් හිරිහැරයන් ඇතිවන බව හෝ වේදනාවක් ඇති කරන දරුණු දුක් ගැහැට ඇතිවන බව හෝ බිය විය යුතුය."**

(අල් කුර්ආන් 24:63)

සලාතය ඒකරාශිව ඉටුකිරීමෙහි අනේක ප්‍රයෝජනයන් ඇත. විශේෂයෙන් මිනිසුන් තම තමන්ව හඳුනා ගැනීම, අල්ලාහ් කෙරේ භක්තිය හා බිය ඇති කර ගැනීම වැනි කාර්‍යයන්හි එකිනෙකා උදව් කරගැනීම, සත්‍ය ඔවුන් අතර දේශනය කර ගැනීම හා ඉවසීම ගැන උපදෙස් දීම වැනි ප්‍රයෝජන ඇති බව කිවහැක. තවද සලාතය ඉටුකිරීමට පසුබටවන්නාට උපදෙස් දී ඔහුගේ අනුවණකම මග හැරීමට උදව්වන අතර අල්ලාහ් ප්‍රශංසා කිරීමද ඇත. මෙවැනි යහපත් ප්‍රයෝජනයන් රාශියක් මෙයින් ඇත. එම නිසා සලාතය එක්රැස්ව ඉටුකිරීමට අධිෂ්ඨාන කර ගනිමු.

සර්වබලධාරි අල්ලාහ් අප සැමට මෙලොව එලොව දෙකෙහිම යහපත ගෙන දෙත්වා. පාප ක්‍රියාවන්ගෙන් ඈත්වී සිටීමටත්, කුහකයින් සමග සම්බන්ධකම් ඇතිකර ගැනීමෙන් වැළකී සිටීමටත් උදව් කරත්වා. සැම ප්‍රශංසාවන්ම ඔහුට හිමිය. මුහම්මද් (සල්) තුමාණන් හා එතුමාගේ පවුලේ අය, හිත මිතුරන් වැනි අයටද අල්ලාහ්ගේ ආශීර්වාද ලැබේවා !

# كتاب الصلاة

## باللغة السنهالية

### تأليف

شريف الدين محمد منصور

حقوق الطبع ميسرة لكل مسلم يريد توزيعه لوجه الله أما من أراد
بيعه فعليه الإتصال بالمكتب هاتف « ٤٣٣٠٨٨٨ ــ ٤٣٣٠٤٧٠ »

# كتاب الصلاة

## باللغة السنهالية

تأليف

شريف الدين محمد منصور

المملكة العربية السعودية ـ المكتب التعاوني للدعوة والإرشاد بالبديعة
قسم الجاليات ـ تحت إشراف وزارة الشئون الإسلامية والأوقاف والدعوة والإرشاد
ص.ب ٢٤٩٣٢ الرياض ١١٤٥٦ ـ ت ٤٣٣٠٨٨٨/٤٣٣٠٤٧٠ ـ فاكس ٤٣٠١١٢٢ المملكة العربية السعودية